සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA3 විභාගය - 2016 ජනවාරි

## (AA31) මූල්‍ය ගිණුම්කරණය හා වාර්තාකරණය

(Financial Accounting and Reporting)

2016-01-30
පෙරවරු
[8.45 – 12.00]

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

පිටු ගණන : 10
ප්‍රශ්න ගණන: 09

(2) ***සියලුම ප්‍රශ්න වලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## A කොටස

අනිවාර්යය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

(a) මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පමය ආකෘතිරාමුව (conceptual framework) අනුව වගකීමක් යන්න **නිර්වචනය කරන්න.** (ලකුණු 02)

(b) වගකීමක් හඳුනාගැනීමේ නිර්ණායක **සඳහන් කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ **සීමාසහිත ABC සමාගම, PQ බැංකුවෙන්** පහත සඳහන් ණය මුදල් ලබාගෙන තිබේ:

| ණය අංකය | ණය ලබා ගත් දිනය | ණය මුදල් ප්‍රමාණය (රු.) | පොලී අනුපාතිකය |
|---|---|---|---|
| 578510020 | 2015.01.01 | මිලියන 7 | 12% |
| 578500004 | 2015.03.15 | මිලියන 8 | 15% |
| 578508903 | 2015.04.30 | මිලියන 10 | 11% |

**සීමාසහිත ABC සමාගම,** 2015 ජූනි 01 දින නව පිරියතක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කළ අතර, ඉදිකිරීම් කටයුතු 2016 සැප්තැම්බර් 30 දින වනවිට නිම වෙතැයි අපේක්ෂා කෙරේ. ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීමෙන් පසු පිරියතෙහි පිරිවැය රු.මිලියන 15 ක් වනු ඇත. 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ ලබා ගත් ණය මුදල් භාවිතකර පිරියතෙහි ඉදිකිරීම් වෙනුවෙන් කරන ලද ආයෝජනය අරමුදල්කරණය (fund) කිරීමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත.

ණය පිරිවැය ලෙස ප්‍රාග්ධනිත කළ යුතු ප්‍රමාණය **ගණනය කරන්න.** (ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

**සීමාසහිත අවිවා පොදු සමාගමේ** 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වාර්ෂික වාර්තාවෙන් පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදී:

| | **රු.(මිලියන)** |
|---|---|
| බදු පසු ලාභය | 23 |
| ලාභාංශ - සාමාන්‍ය කොටස් සඳහා | 0.5 |

පහත දැක්වෙන අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) සාමාන්‍ය කොටසක ප්‍රවර්තන වෙළෙඳපොල මිල රු.25/- කි.

(2) 2015 මාර්තු 31 දිනට පැවති හරිත සාමාන්‍ය සාමාන්‍ය කොටස් ගණන 100,000 කි.

**ඔබ විසින් කළ යුතු දෑ,**

පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(a) කොටසක ඉපැයුම (Earnings Per Share - EPS).

(b) මිල ඉපැයුම් අනුපාතය (Price Earnings Ratio - PE).

(c) ඉපැයුම් ඵලදා අනුපාතය (Earning Yield Ratio). (ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් විශේෂිත ව්‍යාපාර සංවිධාන (Specified Business Enterprises - SBE) සතු ඕනෑම වගකීම් (duties) තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

## <u>B කොටස</u>

අනිවාර්යය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

## 05 වන ප්‍රශ්නය

(a) අස්පෘශ්‍ය වත්කමක් (intangible asset) හඳුනාගැනීමේ නිර්ණායක දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) **සීමාසහිත MM පොදු සමාගම,** ඉහළපෙළේ කාන්තා විලාසිතා ඇඟළුම් නිෂ්පාදනයේ යෙදී සිටින **සීමාසහිත MS සමාගම** අත්පත් කර ගැනීම පිළිබඳව සලකා බලමින් සිටී. **සීමාසහිත MS සමාගමේ** ව්‍යාපාරයේ ස්වභාවය හේතුවෙන් ඔවුන්ට ශේෂපත්‍ර ගත විශාල වත්කම් නොතිබුණි. **සීමාසහිත MS සමාගමේ** ප්‍රධාන විධායක නිළධාරි මෑතදී මාධ්‍යයන්ට ප්‍රකාශ කර සිටියේ **සීමාසහිත MS සමාගමේ** ඉතාමත් වටිනාම වත්කම වන්නේ විසි අවුරුද්දක් පුරා සංවර්ධනය වූ එහි "සන්නම් නාමය" බවත් එය රු. බිලියනයකට අගයකර ඇති බවත් ය.

(i) **සීමාසහිත MS සමාගමට** මෙම සන්නම් නාමය ඔවුන්ගේ මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගත හැකිදැයි **සඳහන් කරන්න**. (ලකුණු 02)

(ii) **සීමාසහිත MM පොදු සමාගම** විසින් **සීමාසහිත MS සමාගම** අත්පත් කර ගතහොත්, **සීමාසහිත MM පොදු සමාගමේ** ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල මෙම සන්නාම් නාමය නිවැරදි ලෙස ගිණුම්ගත කරන ආකාරය **සඳහන් කරන්න**. (ලකුණු 03)

(c) **සීමාසහිත MM පොදු සමාගමේ** පර්යේෂණ කණ්ඩායම දුවිල්ලට සහ දහඩියට ඔරොත්තු දෙන නව රෙදිපිළි (fabric) වර්ගයක් සංවර්ධනය කිරීම පිළිබඳව පර්යේෂණ කරමින් සිටී. ඔවුන් සාර්ථක වුවහොත්, එය පහසුවෙන් ළඟා කර ගත නොහැකි, ළඟාකර ගැනීමක් වන අතර, **සීමාසහිත MM පොදු සමාගමට** අනාගත ආදායම් ප්‍රභවයක් ද වනු ඇත.

මෙම පර්යේෂණය සඳහා **සීමාසහිත MM පොදු සමාගමේ** කළමනාකරණය විශාල මුදල් ප්‍රමාණයක් වැය කරමින් සිටී. පර්යේෂණයේ මුළු පිරිවැය රු. මිලියන 100 ක් වෙතැයි ඇස්තමේන්තු කර ඇති අතර, දැනටමත් එයින් රු. මිලියන 50 ක වියදමක් දරා ඇත.

දැනටමත් වියදම් කර ඇති මෙම රු. මිලියන 50 සම්බන්ධයෙන් ගිණුම්කරණ පිළිවෙත **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

**සීමාසහිත රෝයල් නිට්වෙයා සමාගමේ** 2015 මාර්තු 31 දිනට සහ 2014 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය පහතින් දක්වා ඇත:

**සීමාසහිත රෝයල් නිට්වෙයා සමාගම**

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශන** *(රු.'000)*

| | 2015 මාර්තු 31 දිනට | | 2014 මාර්තු 31 දිනට | |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ජංගම නොවන වත්කම්:** | | | | |
| **දේපල, පිරියත හා උපකරණ:** | | | | |
| දේපල, පිරියත හා උපකරණ | 15,280 | | 14,000 | |
| අඩු කළා: සමුච්චිත ක්ෂය | (5,113) | 10,167 | (4,550) | 9,450 |
| | | | | |
| ආයෝජන | | 2,240 | | 1,900 |
| | | **12,407** | | **11,350** |
| **ජංගම වත්කම්:** | | | | |
| තොග | 850 | | 600 | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 2,500 | | 2,900 | |
| ලැබිය යුතු ආයෝජන ආදායම | 39 | | 50 | |
| මුදල් හා මුදල් සමාන දෑ | 80 | 3,469 | 76 | 3,626 |
| **මුළු වත්කම්** | | **15,876** | | **14,976** |
| **ස්කන්ධය හා වගකීම්** | | | | |
| **ස්කන්ධය:** | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | | 10,800 | | 9,000 |
| පොදු සංචිතය | | 200 | | 2,000 |
| රඳවාගත් ඉපැයීම් | | 1,753 | | 1,020 |
| | | **12,753** | | **12,020** |
| **ජංගම නොවන වගකීම්:** | | | | |
| බැංකු ණය | | 1,200 | | 1,450 |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදනය | | 420 | | 300 |
| | | **1,620** | | **1,750** |
| **ජංගම වගකීම්:** | | | | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | | 1,357 | | 959 |
| උපචිත වියදම් | | 95 | | 174 |
| ගෙවිය යුතු ආදායම් බදු | | 46 | | 65 |
| ගෙවිය යුතු බැංකු ණය පොලිය | | 5 | | 8 |
| | | **1,503** | | **1,206** |
| **මුළු ස්කන්ධය හා වගකීම්** | | **15,876** | | **14,976** |

**සීමාසහිත රෝයල් නිට්වෙයා සමාගම**
**2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**විස්තීර්ණ ආදායම් ප්‍රකාශය** *(රු.'000)*

| | |
|---|---|
| විකුණුම් | 22,000 |
| විකුණුම් පිරිවැය | (13,800) |
| **දළ ලාභය** | **8,200** |
| **වෙනත් ආදායම්:** | |
| ආයෝජන ආදායම් | 560 |
| | 8,760 |
| **අඩු කළා: වියදම්** | |
| බෙදාහැරීමේ වියදම් | 4,680 |
| පරිපාලන වියදම් | 2,730 |
| මූල්‍ය වියදම් | 467 |
| **බදු පෙර ලාභය** | **883** |
| අඩු කළා: බදු | 150 |
| **බදු පසු ලාභය** | **733** |
| වෙනත් විස්තීර්ණ ආදායම් | - |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | **733** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) වර්ෂය සඳහා බැංකු ණය පොලී වියදම රු.217,000/- ක් විය. ඉතිරි මූල්‍ය වියදම් වලින් පෙන්නුම් කරනු ලබන්නේ වැරදීමකින් මූල්‍ය වියදම් යටතේ දක්වා ඇති වර්ෂය තුළ ගෙවන ලද සාමාන්‍ය ලාභාංශය වේ.

(2) 2015 මාර්තු 31 දිනට විකුණුම් කාර්ය මණ්ඩලයට ගෙවිය යුතු දිරිගැන්වීමේ දීමනා රු.90,000/- ක් විය. ගිණුම් පොත්වල මේ ප්‍රමාණය සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(3) වර්ෂය තුළ, සමාගම පාරිතෝෂික ලෙස කිසිදු මුදලක් ගෙවා නොතිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ,**

වක්‍ර ක්‍රමය භාවිත කරමින්, 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත රෝයල් නිට්වෙයා සමාගමේ** මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය **පිළියෙල කරන්න**. (ලකුණු 10)

## 07 වන ප්‍රශ්නය

(a) **STV සමාගම,** 2015 අප්‍රේල් 01 දින රු.2,000,000/- ක පිරිවැයකට, යන්ත්‍රයක් අත්පත් කර ගත්තේය. යන්ත්‍රයේ ප්‍රයෝජනවත් ආර්ථික ජීව කාලය වර්ෂ හතරක්(04) වන් අතර, 4 වන වර්ෂය අවසානයේ අවශේෂ වටිනාකමක් අපේක්ෂා කරනු නොලැබේ. මෙම යන්ත්‍රය වෙනුවෙන් මිලදී ගත් වර්ෂයේදී සම්පූර්ණ ප්‍රාග්ධන දීමනා (එනම් 100% ක්) ලැබීමට සමාගම හිමිකම් කියනු ලැබේ. සමාගමේ සංස්ථාපිත බදු අනුපාතය (corporate tax rate) 28% කි.

(i) 2016 මාර්තු 31 දිනට මෙම ගනුදෙනුවෙන් මතුවන විලම්බිත බදු වත්කමේ / වගකීමේ ප්‍රමාණය (amount of deferred tax asset / liability) **ගණනය කරන්න**.

(ii) අනාගත වර්ෂ වලදී ඉහත (a) (i) හි පිළිතුර සඳහා ඔබ විසින් ගිණුම් තබනු ලබන්නේ කෙසේදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 07)

(b) කල්බද්දක් මූල්‍ය කල්බද්දක් ලෙස වර්ගීකරණය කරනු ලැබීමට තුඩු දෙන සාධක (indicators) තුනක්(03) **හඳුනා දක්වන්න**. (ලකුණු 03)
(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

අනිවාර්ය ප්‍රශ්න දෙක (02) කි.

(මුළු ලකුණු 50)

### 08 වන ප්‍රශ්නය

**සීමාසහිත හීම් පොදු සමාගම** කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත සමාගමකි. 2015 මාර්තු 31 දිනට සමාගමේ ශේෂ පිරික්සුම පහත සඳහන් පරිදි විය:

**සීමාසහිත හීම් පොදු සමාගම**
**2015 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම** *(රු.'000)*

| | හර | බැර |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය (කොටස් මිලියන 2) | | 25,000 |
| 2014 අප්‍රේල් 01 දිනට රඳවාගත් ඉපැයීම් | | 2,020 |
| 13% ණයකර | | 7,500 |
| දේපළ, පිරියත හා උපකරණ - පිරිවැයට: | | |
| මෝටර් වාහන | 26,500 | |
| කාර්යාල උපකරණ | 8,650 | |
| ලී බඩු සහ සවිකිරීම් | 3,100 | |
| <u>2014 අප්‍රේල් 01 දිනට ක්ෂය සඳහා ප්‍රතිපාදන</u>: | | |
| මෝටර් වාහන | | 10,600 |
| කාර්යාල උපකරණ | | 6,488 |
| ලී බඩු සහ සවිකිරීම් | | 1,860 |
| කොටස්වල ආයෝජන - (ලාභ හෝ අලාභ හරහා සාධාරණ මිලට) | 15,000 | |
| තොග | 3,800 | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ / වෙළෙඳ ගෙවිය යුතු දෑ | 24,500 | 14,600 |
| 2013/14 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු ගිණුම | | 360 |
| බැංකු අයිරාව | | 1,100 |
| අතැ'ති මුදල් | 600 | |
| 2014 අප්‍රේල් 01 දිනට අඩමාණ ණය සඳහා දීමනාව | | 360 |
| විකුණුම් පිරිවැය / විකුණුම් | 57,443 | 92,650 |
| ආයෝජන ආදායම | | 1,200 |
| ගෙවන ලද සාමාන්‍ය ලාභාංශ - අතුරු | 1,000 | |
| පරිපාලන වියදම් | 10,150 | |
| විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් | 9,300 | |
| වෙනත් මෙහෙයුම් වියදම් | 2,100 | |
| මූල්‍ය වියදම් | 850 | |
| ගෙවන ලද ආදායම් බදු | 745 | |
| | **163,738** | **163,738** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2014 සැප්තැම්බර් 30 දින සමාගම එහි පැරණි වෑන් රථයක් අලුත් වෑන් රථයකට හුවමාරු කර ගන්නා ලදී. හුවමාරු කළ දිනට පැරණි වෑන් රථයේ පොත් අගය රු.576,000/- ක් විය. පැරණි වෑන් රථය මිලදී ගෙන තිබුණේ 2011 අප්‍රේල් 01 දිනය. අලුත් වෑන් රථය සඳහා ඉතිරි මුදල් ගෙවීම වශයෙන් සමාගම රු.900,000/- ක් ගෙවූ අතර, එමගින් අලුත් වෑන් රථයේ වෙළෙඳපොල වටිනාකමින් 2/3 ක් නියෝජනය කරනු ලැබේ. මුදල් ගෙවීම ගැනුම් යටතේ වාර්තා කර තිබුණි. ඒ හැර, මේ සම්බන්ධයෙන් ගිණුම් පොත්වල වෙනත් සටහන් තැබීමක් සිදු කර නොතිබුණි.

(2) වර්ෂය තුළ සමාගම පහත දැක්වෙන වත්කම් මිලට ගන්නා ලදී:

| දිනය | වත්කමේ නම | වටිනාකම (රු.) |
|---|---|---|
| 2014.04.30 | විධායක පුටු 3 ක් | 18,000 |
| 2015.02.01 | මුද්‍රණ යන්ත්‍රය (Printer) | 135,000 |

(3) වර්ෂය තුළ, පහත සඳහන් වත්කම සමාගමේ භාවිතයෙන් ඉවත් කරන ලදී:

| ඉවත් කළ දිනය | වත්කමේ නම | ගැනුම් පිරිවැය (රු.) | 2014.04.01 දිනට සමුච්චිත ක්ෂය (රු.) |
|---|---|---|---|
| 2014.12.31 | ලැප්ටොප් පරිගණකය | 110,000 | 110,000 |

(4) සරල මාර්ග ක්‍රමයට පිරිවැය හෝ ප්‍රත්‍යාගණිත අගයන් මත ක්ෂය වීම් ගණනය කරනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ වල ප්‍රයෝජනවත් ආයු කාල පහත සඳහන් පරිදි වේ:

| | | |
|---|---|---|
| මෝටර් වාහන | : | වර්ෂ 5 |
| කාර්යාල උපකරණ | : | වර්ෂ 10 |
| ලී බඩු සහ සවිකිරීම් | : | වර්ෂ 10 |

(5) ණයගැතියන් සම්බන්ධයෙන් පහත දැක්වෙන ගැලපීම් කළ යුතුව ඇත:

- සමාගමට රු.45,000/- ක් ගෙවිය යුතුව තිබූ ගනුදෙනුකරුවෙකු බුන්වත් බව ප්‍රකාශ කර තිබුණි. මෙම ප්‍රමාණය සඳහා පසුගිය වර්ෂයේ දී අඩමාන ණය ප්‍රතිපාදනයක් සලසන ලදී.
- 2013/14 වර්ෂයේ දී ලියා හරින ලද රු.61,000/- ක බොල්ණය මුදලක් ප්‍රවර්තන වර්ෂය තුළ සමාගමට ලැබී තිබුණි. මෙම මුදල වෙළෙඳ ලැබිය යුතු දෑ ගිණුමට බැර කර ඇත.
- ප්‍රවර්තන වර්ෂය සඳහා රු.93,000/- ක අතිරේක ප්‍රතිපාදනයක් කළ යුතුව ඇත.

(6) 2015 මාර්තු 31 දිනට පහත සඳහන් උපචිත වියදම් සඳහා ප්‍රතිපාදන කළ යුතුව ඇත:

| | රු. |
|---|---|
| කාර්යාල කුලී | 800,000 |
| විකුණුම් කාර්ය මණ්ඩලයට ප්‍රසාද දීමනා | 68,000 |

(7) වර්ෂය වෙනුවෙන් ණයකර සඳහා පොලී ගෙවා නොමැති අතර මූල්‍ය ප්‍රකාශනවල ඒ සඳහා ප්‍රතිපාදන ද සලසා නොතිබුණි.

(8) වර්ෂය අවසානයේ දී ආයෝජනයේ වටිනාකම රු.950,000/- කින් හානිකරණය වී ඇති බව සමාගම හඳුනා ගන්නා ලදී.

(9) පෙර වර්ෂයේ අවසාන තොගය රු.35,000/- කින් වැඩිපුර ඇගයීම් කර ඇති බව හඳුනාගන්නා ලද අතර, මේ සඳහා ගැලපීම් කළ යුතුව ඇත.

(10) 2014/15 තක්සේරු වර්ෂය සඳහා සමාගමේ බදු වගකීම රු.750,000/- ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

(11) 2015 මැයි 20 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දී, 2015 මාර්තු 31 දිනට පැවති සෑම සාමාන්‍ය කොටසක් සඳහාම කොටසකට රු.1/- බැගින් වූ ලාභාංශයක් ගෙවීමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන ලදී.

(12) 2015 ජූනි 20 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා අනුමත කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ,**

ප්‍රසිද්ධ කිරීමට සුදුසු ආකාරයෙන් **සීමාසහිත හීම් පොදු සමාගමේ** පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය. (ලකුණු 08)

(b) 2015 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 08)

(c) 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධයේ වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය. (ලකුණු 03)

(d) දේපළ, පිරියත සහ උපකරණ වලට සටහන්. (ලකුණු 06)

(මුළු ලකුණු 25)

## **09** වන ප්‍රශ්නය

(a) **සීමාසහිත අතුලා පොදු සමාගම,** 2014 අප්‍රේල් 01 දින **සීමාසහිත බේමා සමාගමේ** සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් 80% ක් අත්පත් කර ගන්නා ලදී.

**සීමාසහිත අතුලා පොදු සමාගමේ** සහ **සීමාසහිත බේමා සමාගමේ** 2015 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත දක්වා ඇත:

**2015 මාර්තු 31 දිනට**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශන** *(රු.'000)*

| | **සීමාසහිත අතුලා පොදු සමාගම** | **සීමාසහිත බේමා සමාගම** |
|---|---|---|
| **වත්කම්:** | | |
| **ජංගම නොවන වත්කම් (ලියා හරින ලද අගයට):** | | |
| දේපළ, පිරියත හා උපකරණ | 28,600 | 9,550 |
| | **28,600** | **9,550** |
| **ආයෝජනය:** | | |
| **සීමාසහිත බේමා සමාගමේ** සාමාන්‍ය කොටස් | 13,500 | - |
| **ජංගම වත්කම්:** | | |
| තොග | 5,650 | 3,300 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 6,430 | 4,425 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 1,210 | 525 |
| | **13,290** | **8,250** |
| | **55,390** | **17,800** |
| **ස්කන්ධය සහ වගකීම්:** | | |
| **ස්කන්ධය:** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | 41,000 | 13,000 |
| **සංචිත:** | | |
| පොදු සංචිතය | 1,100 | 600 |
| රඳවාගත් ඉපැයීම් | 4,120 | 1,800 |
| | **5,220** | **2,400** |
| **වගකීම්:** | | |
| **ජංගම නොවන වගකීම්:** | | |
| බැංකු ණය | - | 860 |
| **ජංගම වගකීම්:** | | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | 8,500 | 1,350 |
| උපචිත වියදම් | 550 | 155 |
| ගෙවිය යුතු ආදායම් බදු | 120 | 35 |
| | **9,170** | **1,540** |
| | **55,390** | **17,800** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) අත්පත් කරගත් දිනයේදී **සීමාසහිත බේමා සමාගම** විසින් එහි වත්කම් ප්‍රත්‍යාගණනය කරන ලදී. ප්‍රත්‍යාගණනය තුලින් නිරීක්ෂණය වූයේ ඉඩමේ සාධාරණ අගය එහි පොත් අගයට වඩා රු. මිලියන1.5 කින් වැඩි වී ඇති බවය. මෙම සාධාරණ වටිනාකම් ගැලපීම ගිණුම් පොත්වලට ඇතුලත් කර නොතිබුණි. අනෙකුත් වත්කම් වල සාධාරණ වටිනාකම් නොවෙනස්ව පැවතිණි.

(2) අත්පත් කරගත් දිනයේදී පාලනයට යටත් නොවන හිමිකමෙහි සාධාරණ වටිනාකම රු.3,900,000/- ක් ලෙස ඇගයීම් කරන ලදී.

(3) 2014 අප්‍රේල් 01 දිනට, **සීමාසහිත බේමා සමාගමේ** පොත්වල පහත සඳහන් ලෙජර් ශේෂ පෙන්නුම් කරන ලදී:

| | | |
|---|---|---|
| පොදු සංචිතය | - | රු.400,000/- |
| රඳවාගත් ඉපැයීම් | - | රු.400,000/- |

(4) ඒකාබද්ධ කිරිමේදී ඇති වූ කීර්තිනාමය රු.60,000/- කින් හානිකරණය වී ඇති බව 2015 මාර්තු 31 දින **සීමාසහිත අනුලා පොදු සමාගම** විසින් හඳුනාගන්නා ලදී.

(5) **සීමාසහිත අනුලා පොදු සමාගම** විසින් **සීමාසහිත බේමා සමාගමට** පිරිවැය මත 20% ක ලාභාන්තිකයක් සහිතව භාණ්ඩ විකිණීම සිදු කරනු ලැබේ. **සීමාසහිත අනුලා පොදු සමාගමෙන්** මිලදී ගත් රු.66,000/- ක් වටිනා තොග, **සීමාසහිත බේමා සමාගමේ** 2015 මාර්තු 31 දිනට වූ තොගයේ ඇතුලත් වී තිබුණි.

(6) **සීමාසහිත අනුලා පොදු සමාගම,** රු.1,600,000/- ක ධාරණ අගයක් සහිත මෝටර් කාර් රථයක්, 2014 අප්‍රේල් 02 දින, **සීමාසහිත බේමා සමාගමට** රු.1,760,000/- කට විකුණන ලදී. සමාගම් දෙකෙහිම මෝටර් වාහන, පිරිවැය මත 25% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ,**

2015 මාර්තු 31 දිනට, **සීමාසහිත අනුලා පොදු සමාගමේ** ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය **පිළියෙල කරන්න**.

(ලකුණු 18)

(b) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 27 (LKAS 27) ඒකාබද්ධ සහ වෙන් වශයෙන් වූ මූල්‍ය ප්‍රකාශන ප්‍රමිතය ප්‍රකාර පහත සඳහන් යෙදුම් (terms) **නිර්වචනය කරන්න**:

(i) පරිපාලකය (a parent).

(ii) පරිපාලිතය (a subsidiary). (ලකුණු 04)

(c) අනුපාත විශ්ලේෂණයක ඇති සීමාවන් තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැළකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |